www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට්, චිත්‍රපටය ඇමරිකාව තුල මෙතරම් ජනකාන්ත ප්‍රතිචාරයක් පැන නැංවූයේ ඇයි?

**Why has *The Passion of the christ* evoked such a popular responce in America?**

*ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට්, අධ්‍යක්ෂනය: මෙල් ගිබ්සන්, තිරනාටකය: මෙල් ගිබ්සන් හා බෙනඩික්ට් ෆ්‍රිට්ස්ජෙරල්ඩ්*

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**

**2004 මාර්තු 05**

මෙල් ගිබ්සන්ගේ ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට් (''ක්‍රිස්තුන්ගේ වධ විඳීම'') අතිශය අප්‍රියකර චිත්‍රපටයක් වන නමුදු වැදගැන්මකට නැත්තක් නො වේ. මෙම චිත්‍රපටය යේසුස්ගේ ජීවිතය හෝ ඔහුගේ ඉගැන්වීම් පිලිබඳව, හෝ වත්මන් ජීවිතය කෙරෙහි ආගමට වන සබඳතාව පිලිබඳව (අඩු ගනනේ අදහන්නෙකුගේ දෘෂ්ටි කෝනයෙන් වත්) අපගේ අවබෝධයට කිසිදු ප්‍රතිපදානයක් ප්‍රදානය නො කරන අතරතුර එය නිශ්චිත තත්කාලීන ඇමරිකානු මානසිකත්වයක් හා මනෝගතියක් තුලට අන්තර්ඥානයක් සපයයි. එකී අර්ථයෙන් ගත් කල, ගිබ්සන්ගේ චිත්‍රපටය දේව ධර්ම ශාස්ත්‍රය පිලිබඳ කෘතියක මට්ටමටවත් ලඟා නොවන, එතරම්වත් බැරෑරුම් කලාත්මක ප්‍රයත්නයක් නොවන ස්වයංචරිතාපදානමය ආත්ම විලාපයකි - එබඳු සැලකුම් ලැබීමට උචිත වේ.

ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට් චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීම ගෙවී ගිය සතියේ එක්සත් ජනපදය තුල මහා ඝෝෂාවක් මැද්දේ, ඇරඹුනු අතර එය, විශේෂයෙන් ම මූලධර්මවාදී ක්‍රිස්තියානි බැතිමතුන් අතර විසල් ප්‍රේක්ෂකත්වයක් ආකර්ෂනය කර ගෙන ඇත. පොදු වේ ද ගත් කල ඇමරිකානු ජන මාධ්‍යය මහත් ගෞරවයෙන් චිත්‍රපටයට සලකා ඇත. රූපර්ට් මර්ඩොක්ගේ ටැබ්ලොයිඩ් පුවත්පත වන නිව් යෝර්ක් පෝස්ට් මෙන් ම නිව් යෝර්ක් ඩේලි නිව්ස් පුවත්පත ද සිය මුල් පිටුව චිත්‍රපටය වෙනුවෙන් කැප කලේ ය. එය සෑම ප්‍රධාන පුවත්පතක ම මුල් පිටුවල අවධානය දිනා ගැනීමට පාඨයන් සකස් කර රූපවාහිනියෙහි පලල් දර්ශනයන් ලබා ගැනීමට ද සමත් ව ඇත. ඒ අතර මෙම චිත්‍රපටය සමහර අංශවල, විශේෂයෙන් ලිබරල් හා යුදෙව් ටීකාකරුවන්ගේ, දෝෂදර්ශනයට ලක් විය.

*වධ විඳීම* නිපදවීම සම්බන්ධ මූලික කරුනු දැන් පලල්ව ප්‍රචලිත ය. පසුව ගිය දශක දෙක පුරා ක්‍රියාදාමමය හා නාට්‍යමය චිත්‍රපට ගනනාවක ප්‍රමුඛ ඇක්ෂන් නලුවකු වූ ගිබ්සන් - 1962-65 දෙවන වතිකානු සභාවේ ප්‍රතිසංස්කරන ප්‍රතික්ෂේප කරන බොහෝ නිකායන්ගෙන් එකක් වන - කුඩා සාම්ප්‍රදායිකවාදී කතෝලික කන්ඩායමකට අයත් වෙයි. ඔහුගේ පියා වන හට්න් ගිබ්සන් දශක ගනනාවක් තිස්සේ ක්‍රියස්තියානි සභාවේ නායක පූජක මන්ඩලයට ගර්හා කිරීමේ යෙදී සිටින සර්වදාහ්‍ය පූජාවේ ප්‍රතික්ෂේප කරන්නෙකි. අනෙකුත් දේ අතර, ක්‍රිස්තුන්ගේ මරනය පිලිබඳ වගකීමෙන් යුදෙව් ජනතාව නිල වසයෙන් නිදහස් කල දෙවන වතිකානු සභාව ''යුදෙව්වන්ගේ පිටු බලය ලද මේසන්වාදී කුමන්ත්‍රනයක්[1]'' යැයි ජ්‍යෝෂ්ට ගිබ්සන් පවසයි.

චිත්‍රපටි නලුවා ලතින් හා ඇරමික භාෂාවලින් [2] ඉතාලියෙහි රූගත කල ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට් චිත්‍රපටය සඳහා පෞද්ගලිකවම මුදල් යෙදී ය. එහි ප්‍රධාන නලුවා වූයේ තවත් බැතිමත් කතෝලිකයෙකු වූ ජේම්ස් කැවිසේල් ය. (ඔහු රඟ පෑ තවත් චිත්‍රපටයක් වූයේ ද තින් රෙඩ් ලයින් ය.) ''මේ භූමිකාව නිරූපනය කිරීම සඳහා මා කැඳවනු ලැබුනු බව මම අදහමි'' යි - ''ද සෙවන් හන්ඩ්‍රඩ් ක්ලබ්'' නමින් රූපවාහිනියෙහි එන ක්‍රිස්තියානි සංවාද වැඩ සටහනක[3] පසු ගිය පෙබරවාරියෙහි නිවේදනය කලේ ය. ගිබ්සන් තම කෘතිය ප්‍රබල ලෙස විවේචනයට ලක් කරන අය බැහැර කරමින් ක්‍රිස්තියානි මූලධර්මවාදීන් හා අනෙකුත් දක්ෂිනාංශික දේශපාලන හා මාධ්‍ය තැනැත්තන් හමුවේ තම චිත්‍රපටයේ දල පිටපතක් පලමුව පසුගිය වසරේ දී තිරගත කලේ ය.

නව තෙස්තමේන්තුවේ සුභාරංචි සතරේ ද පසුකාලීන වර්නනාවල ද, විශේෂයෙන් ම ගූඪවාදියෙකු හා යුදෙව් විරෝධියෙකු වන ජර්මානු ඔගස්තීනියානු කන්‍යා සොයුරියක වන කැතරීන් එමරීච් (1774-1824) ලියූ, <u>*වධවිඳීම*</u> පිලිබඳ පසු කාලීන වර්නනාවල ද විස්තර කර පරිදි යේසුස්ගේ දිවියේ අවසන් හෝරා 12 චිත්‍රපටියේ වස්තු විෂයය වේ. එමරීච්ගේ ද ඩොලරස් *පැෂන් ඔෆ් අවර් ලෝර්ඩ් ජීසස් ක්‍රයිස්ට්* (''අප දෙව් යේසුස් ක්‍රිස්තුන්ගේ දුක්ඛිත වධ විඳීම'') නම් කෘතිය

ශුභාරංචි විස්තරවලට වධ බන්ධන ලෝලී තොරතුරු එකතු කරන අතර එය,''කෲර,'' ''දුෂ්ට'' සහ ''අනුකම්පා විරහිත'' වූ ''යුදෙව් කල්ලිය'' ගැන කරන සඳහන් කිරීම් පිරී පවතී.

ඇතැම් විට ඊට පෙර බෙදා හැරුනු අනෙක් ඕනෑ ම චිත්‍රපටයකට වෙනස්ව ගිබ්සන්ගේ චිත්‍රපටය පිළිකුල උපදවන තරමට ම දරුනු ය. හෝරා දෙකක් තිස්සේ සැබවින් ම නො නැවතී මිනිසෙකුට තලනු ලබයි, මිටින් ඇනෙයි, කෙල ගසනු ලැබෙයි, කස පහර දෙවෙයි, කටු සැමිටියෙන් තැලෙයි, වධ කෙරෙයි, අවසන කුරුසියකට තබා ඇන ගැසෙයි. ලේ වැකි, තැති ගන්වන තොරතුරු සියල්ල අභිරුචියෙන් රූපගත කෙරී ඇත. ප්‍රතිරූපවලින් හා වෘත්තාන්තමය ප්‍රහාරයන් සම්බන්ධයෙන් ගත් කල ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට් චිත්‍රපටය ප්‍රගාඪව යුදෙව් විරෝධී ද වේ. පුදුම එලවන ලෙස සමස්ත වියරුකර, සාහසික කෘතිය ම හැඟීම් ජනනය කරන්නේ නැත.

පෘථිවිය මත යේසුස්ගේ පැවැත්මෙහි අවසන් දින අඩට තමන් සීමා වූයේ ''කැප කිරීමෙහි සුවිසල් බව'' අවධාරනය කිරීම සඳහා යැයි චිත්‍රපටකරුවා ස්ථිරව කියා සිටියි. එහෙත් පෙනී යන්නේ ඊට වඩා වෙනස් වූ පරමාර්ථ ද පවතින බව යි. ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට්හි පටු විෂය ක්ෂේත්‍රය යේසුස්ගේ ආගමික හා සමාජමය පනිවුඩය පිලිබඳව කිසිදු බැරෑරුම් සාකච්ඡාවක් ඇති විය නො හැකි තත්වයක් නිර්මානය කරයි. ජෙරූසලෙමවාසී පුලුල් යුදෙව් ජන ස්තරයක් තුල යේසුස්ට පැවති ජනප්‍රියත්වය පිලිබඳ කරුන ද එය බැහැර කරයි. එසේ වුවත් 'ශුභාරංචිවලට' අනුව ඔහුගේ මරනයට යන්තම් දින කීපයක් තිබිය දී කුල්මත් ජන සමූහයෝ යේසුස් සාදරයෙන් නගරය තුලට පිලිගත්හ. වධ විඳීම පිලිබඳ විස්තර බොහොමයක් ම ඇරඹෙන්නේ මෙම විජයග්‍රාහී පිවිසුමෙනි.

අනෙක් අතට ගිබ්සන්ගේ කෘතිය ඇරඹෙන්නේ ගෙත්සෙමනේ උද්‍යානයේ දී කුරුසියේ ඇන ගැසීමට පෙර දා රෑයේ දී සිදු වූ යේසුස්ගේ අභ්‍යන්තර අරගලයෙනි. එලඹෙන දෙය පෙරදකිමින් කුසලානය තමන්ගෙන් ගිලිහී දූමෙන්නේ දැයි ඔහු දෙවියන්ගෙන් විචාලේ ය, කෙසේ වුව ''ඔබගේ කැමැත්ත ඉටු වනු ඇතැ''යි ද ඔහු කියා සිටියේ ය. අශුභදායක, ද්විලිංගික සාතන් ඔහු වරදට පොලඹා ඔහුට සරදම් කරයි (චිත්‍රපටය පුරා ඔහු/ ඇය යලි යලිත් පෙනී සිටියි).

සිය ආදී ශ්‍රාවක ජූදාස්ගේ පාවා දීම හරහා යේසුස් අත් අඩංගුවට ගනු ලැබේ. ප්‍රධාන යුදෙව් පූජකයන් පිටත් කර හැරි සන්නාහ සන්නද්ධ මිනිසුන් යේසුස්ව රාත්‍රියේ දී අත් අඩංගුවට ගත්තේ ඇයි? ගිබ්සන්ගේ චිත්‍රපටය කිසි විටෙකත් මේ ප්‍රශ්නය අමතන්නේ නැත. මක්නිසාද යත්, බැරෑරුම් පිලිතුරක් මගින් ජනකාන්ත පෞරුෂයකින් යුක්ත අනාගත වක්තෘවරයා සිරගත කිරීම මහජන විරෝධයට තුඩු දෙනු ඇතැයි යන නිලධර තාන්ත්‍රික භීතිය මෙනෙහි කිරීමට සිදු වන නිසා ය.

අන්තයට ගිය කෲරත්වය ආරම්භ වන්නේ යේසුස් අත් අඩංගුවට පත් ක්ෂනයෙහි ම මෙනි. එමරිච්ගේ එකතු කිරීමක් නාට්‍යමයව දක්වමින් විලංගු ලූ දම්වැල් අගින් යේසුස් පාලම් වැටක් මත එල්ලා මරනාසන්න වන තත්වයකට පත් කරන අවස්ථා මෙහි දී ගිබ්සන් නිර්මානය කරන්නේ ය.

කේයාෆස් නායකත්වය දුන් ප්‍රධාන යුදෙව් පූජකයන් ඉදිරියට ගෙන යන ලදුව මිථ්‍යා දෘෂ්ටිකයෙකු හා දෙවියන්ට අවමන් කරන්නෙකු යැයි යේසුස් හෙලා දකේ. තමන් දෙවියන්ගේ පුත්‍රයා බවට උරුම කියන්නේ දැයි ඔවුහු ඔහුගෙන් දැඩිව ප්‍රශ්න කලහ. ''එසේ ය'' යි ඔහු පිලිවදන් දෙයි. යේසුස් පිලිකුලට බඳුන් කොට තව තවත් නින්දා කෙරේ. ''මරනය!'' පාපී යුදෙව්වෝ යටි ගිරියෙන් කෑ ගසති.

නායක යුදෙව් නිලධරයන් කෙරෙහි වන ගිබ්සන්ගේ ප්‍රවිෂ්ටය ගැන ලියමින් *නිව් රිපබ්ලික්* පුවත්පතේ ලියොන් වීසෙල්ටයර් නිවැරදිව මෙසේ ලියයිඃ ''මාෂියා ස්බ්‍රාජියා නමැති නලුවෙකු පිලිකුල් රසයෙන් යුතුව රඟන කේයාෆස්ගේ චරිතය ඕබරේමර්ගෝවෙන් [යුදෙව්වන් ''ක්‍රිස්තුන් ඝාතකයන්'' ලෙස චිත්‍රිත මධ්‍ය කාලීන ජර්මානු පාස්කු නාට්‍යයක් රඟ දැක්වූ ස්ථානයකි] නො වලහා උපුටා ගැනෙන්නකි. සිය පූජක සගයන් මෙන් ඔහු ද යුදෙව් ධර්මාචාර්යයන්ගේ පාලක බඳු පැසෙන රවුලින් යුතු ය, බැරෑරුම් වන අවඥා සහගත බවකින් කතා කරයි, මුදල් පාටැති නූල් පොටවලින් ගනන් තබනු පිනිස කන්තු කැපූ ලී කැබැල්ලක වැනි ඉරි යෙදූ සාටකයක් යටින් ප්‍රයෝගකාරීව ගමන් කරයි. ඔහු ස්වර්නමය හා අනුකම්පා විරහිත වෙයි. ඔහු කරන එක ම දෙය නම් මරන දඬුවම දෙන ලෙස ඉල්ලා සිටීම යි.'' වීසෙල්ටයර් නිරීක්ෂනය කරන අයුරු මේ වනාහි ''සුභාවිත ලෙස යුදෙව් විරෝධී වන ප්‍රතිරූපයෝ '' ය.

පොන්ටියස් පිලාත් සහ අනෙකුත් රෝමානු නිලධරයන් යේසුස්ට මරන දන්ඩනය පැනවීම මග හැරීම සඳහා මං සොයමින් වැනි වැනී සිටිය දී යුදෙව් නායකයෝ අත්‍යන්තයෙන් ම නිර්දය වෙති. ඔවුහු සදා කල්හි ම කුපිත වූවන් හා ලේ පිපාසිතයෝ බවට පත් වෙති. ගිබ්සන් එමරිච්ගේ බෙරිහන් දීම්වල සාරය අනුයයිඃ ''... [යේසුස්ගේ] දුක්පීඩාවන් දැකීම දැඩි සිතැති යුදෙව්වන් තුල අනුකම්පාවේ හැඟීමක් උපදනවා වෙනුවට ඔවුන් පිලිකුලෙන් පුරවා වියරුව උත්සන්න කලේ ය. ඇත්ත වසයෙන් ම දයාව යනු ඔවුන්ගේ නපුරු හදවත් නො දන්නා හැඟීමක් විය.''

කේයාෆස් හා ''යුදෙව් කල්ලිය'' යේසුස්ගේ මරනය ඉල්ලා සිටින නමුත් පිලාත් පොරොන්දු වනුයේ ඔහුට ''දඬුවම් කිරීම'' පමනි. යේසුස් හට කස පහර දීමට,

තැලීමට, කටු සැමිටි පහර දීමට මෘග රෝම සොල්දාදුවන් කන්ඩායමක් ප්‍රමුදිතව ආරම්භ කරයි. අඩ හෝරාවකටත් වඩා කාලයක් තිස්සේ සිදුවන මෙම දර්ශනය චිත්‍රපටයෙහි එන ඉතා ම අරුචිකර දර්ශනවලින් එකකි. මෘග සොල්දාදුවෝ පලමුව මුගුරුවලින් තලති, අනතුරුව කසයෙනි, ඉනුත් අනතුරුව නොයෙක් පට අගිසිවල ලෝහ විලි සවි කල ගැට සහිත පට නවයකින් යුත් සැමිටි වර්ගයකිනි. අවසන කී සැමිටි වර්ගය පලමුව ලීමුවා මේසයක් මතට පහර දී පිරික්සයි, එවිට එය ලී කුට්ටි ඉරා දමයි. යේසුස්ගේ පිටි පසට ඉන් පහර දුන් කල්හි මස් හා සම් කැබලි වා තලයෙහි ඉගිල යයි. කිසිදු මනුෂ්‍යයෙකුට නො ඉවසිය හැකි මේ තැලීම නිමාවෙහි යේසුස් සිරුර කටු නැති, ලේ වැකි මස් ගොඩක් බවට පත් වේ. ක්‍රිස්තුන්ගේ හිස මත කටු ඔටුන්න පැලඳවීම අතිරේක වධයක් සහ ලේ වැගිරීමක් සඳහා අවස්ථාවක් වෙයි.

හම ගැසුනු, ආසන්න වසයෙන් සිහි සුන් යේසුස් තමන් අබිමුවට ගෙන එන කල තව මත් නො සන්සිඳුනු යුදෙව් කල්ලිය ඔහුගේ මරනය ඉල්ලා සිටී. මහජන නො සන්සුන්තාව කෙරෙහි බියෙනැලලී ඔවුන්ගේ ඉල්ලීම්වලට යටත් වන පිලාත් කුරුසියේ තබා ඇන ගැසීමට අවසරය දෙයි. කල්වාරි කඳු පියෙස වෙත දූවැන්ත දාරුමය කුරුසිය උසුලා ගෙන යාමට යේසුස්ට බල කෙරේ. (ශුභාරංචි තුනක ම අන් මිනිසෙක් එය ගෙන යයි, ඓතිහාසිකව ගත් විට කුරුසි කඳක් ගෙන යාමට බල කලේ අපරාධකරුවන්ට පමනකි). බී මත් රෝමානු සොල්දාදුවන් තම ගොදුර මත නො ඉසිලිය හැකි වේදනාවන් පමුනුවන යේසුස්ගේ දෙඅත්වලට හා දෙපාවලට ඇන ගැසීමේ දර්ශන පෙල තවත් භයංකර දර්ශනයකි. තම කුරුසියෙහි සිරව තමන්ව වධබන්ධනයට ලක් කලවුන් උදෙසා සමාව යැදි යේසුස් අනතුරුව මිය යයි. සේනාංග නායකයෙකු යේසුස්ගේ ඇලපතට හෙල්ලකින් අනින විට රුධිර ධාරාවන් ගලා යයි. අවසානයේ දී පසු කොටසකින් කියැවෙන්නේ සිය දෙඅත්ලෙහි සිදුරු විනා නිකැලැල්ව යේසුස් මලවුන්ගෙන් නැගිටීම යි.

## ගිබ්සන්ගේ න්‍යාය පත්‍රය

මේ සියල්ලේ අර්ථය අප වටහා ගන්නේ කෙසේ ද?

ගිබ්සන් හැකියාවෙන් තොර අයෙක් නො වේ. නලුවෙකු ලෙස ඔහු සතුව නිසැක දක්ෂතා ඇත. ඔහුගේ හැම්ලට් (ෆ්‍රැන්කෝ සෙෆිරිල්ලිගේ නිර්මානයකි) දීප්තිමත් නො වූවත් සැහුනි, එහි සමහර අවස්ථා හද සසල කලේ ය. ඇමරිකාවේ උපත ලැබ ඕස්ට්‍රේලියාවේ හැදී වැඩුනු ගිබ්සන් අධිසාහසික *මැඩ් මැක්ස්* (''උමතු මැක්ස්'') හා *ලීතල් වෙපන්* (''මාරක අවිය'') මාලාව වැනි චිත්‍රපට සමග එක පෙලට 1970 ගනන් අග දී මතුව ආ ඕස්ට්‍රේලියානු අධ්‍යක්ෂවරුන්ගේ ''නව රැල්ල'' (පීටර් වියර් සහ ගිලියන් ආම්ස්ට්‍රෝන්ග්) නිර්මානය කල චිත්‍රපට ගනනාවක පෙනී සිටියේ ය. *ටිකිලා සන්රයිස්* (''ටිකිලාවේ හිරු උදාව'') හා *ද රිවර්* (''ගඟ'') වැනි කෘතිවල දී සාපේක්ෂ වසයෙන් අකුටිල වූ රංගනයන් ලබා දීමට ඔහුට හැකි විය. ඔහුගේ පෞරුෂත්වයේ බාහිර ස්වරූපය (ඔහුගේ තථ්‍ය පෞරුෂත්වයේ යමක් මෙහි දී තම ප්‍රකාශනය අත් කර ගනු ඇත) අව්‍යාජ ප්‍රියමනාප භාවය, මංමුලා සහගත භාවය, මරනය නො තකන නිර්භීත භාවය යන සමාන පැතිකඩ තුනකින් ප්‍රකාශිතව ඇත.

අධ්‍යක්ෂවරයෙකු ලෙස පවා (*ද මැන් විතවුට් එ ෆේස්* ([මුහුනක් නැති මිනිසා], *බ්‍රේව්හාර්ට්* [නිර්භීත අධිෂ්ඨානය], ගිබ්සන්ට සාර්ථකත්වයන් අත් කර ගන තිබේ. වධ විඳීමේ දී පොන්ටියස් පිලාත් කෙරෙහි ඔහු දක්වක සැලකිල්ල -- චිත්‍රපටය තුල නිර්ව්‍යාජ ප්‍රතිවිරෝධතාව ප්‍රදර්ශනය කිරීමට ඉඩ ලද එක ම චරිතය එය විය හැකි ය. -- එක්තරා සංවේදිතාවක් ප්‍රකට කරයි. පිලාත් වනාහි වටහා ගනුව ඔහු ඒ මේ අත හරවා බලන තැනැත්තෙකි. ඒ අයුරින් යුදෙව් නායකයන්ට සැලකීමෙන් ගිබ්සන් වලක්වනු ලැබ ඇත්තේ දෘෂ්ටිවාදය විසින් යැයි පෙනී ය යි.

පොදුවේ ගත් කල චරිත නිර්මානයන් සියල්ල සැකිලිමය වේ. කෙනෙකුගේ දෑස් රුධිර ගලනයට හුරු කෙරෙයි. නැතහොත් දෑස් ඉවත හැරවෙයි. සමස්ත ප්‍රතිඵලය වනුයේ වෙහෙසකර බව හා ඒකාකාරී බව යි. මෙය සිත් ආකර්ෂනය වන කලාමය හෝ බුද්ධිමය අත්දැකීමක් නො වේ. තව දුර කියන්නේ නම් හාස්කම් කිහිපයක් නියමය පරිදි වාර්තා කරතත් ආගම සහ ආගමික විශ්වාසයන්හි පවතින පූජනීයත්වය, පුරෝකථන සහ වීර කාව්‍ය ආදී අංග විමසා බලනු වස් චිත්‍රපටය කරන දෙයක් නැත. එවෙනුවට සමස්ත කාර්යය ම වැඩකට නැති, උදාසීන සහ ආන්තික ප්‍රචන්ඩත්වය පසෙක තැබූවිට - මුලුමනින් ම අමතක වනසුලු ය.

යමෙකුගේ දෙඇස් ඉදිරියෙහි විරෝධය නො පාන හා සැබවින් ම අබල වූ මනුෂ්‍ය ශරීරයක් විනාශ කිරීම මහත් සේ භයංකර දර්ශනයක් වෙයි, එහෙත් අවශ්‍යයෙන් ම ගැඹුරු සංවේදනයක් දනවන්නේ නො වෙයි. යේසුස්ගේ මරනයෙහි අර්ථභාරය හඟින්නට ඔහුගේ ජීවිතයේ අර්ථභාරය පිලිබඳව යම් වැටහීමක් තිබිය යුතු ය. ඔහුගේ ආගමේ ගැඹුර පිලිබඳව ගිබ්සන් කොතෙකුත් ප්‍රකාශයන් කරන්නේ වුව ද නිර්මානය කෙරී ඇත්තේ බෙහෙවින් ම අජීවී, වැදගැම්මකට නැති යේසුස් ක්‍රිස්තුන් කෙනෙකි. ඔහුගේ මව වන මරියා, මරියා මැග්ඩලීනා සහ ඔහුගේ ආධාරකරුවන් තැති ගත් ප්‍රේක්ෂකයෝ බවට සිඳුවෙති. ක්‍රියාව හා ජීවය මුලුමනින් ම වාගේ රුදෙනුයේ වධකයන් හා පීඩකයන් සමගිනි. එය අමුතුම තත්වයකි. මෙම චිත්‍රපටය ආගම

පිළිබඳ සංශයවාදියෙකු හෝ දෙගිඩියා සහගතයෙකු ඒත්තු ගන්වනු ඇත්තේ කෙසේ දැයි තේරුම් ගැනීම අපහසු ය.

යේසුස් පිළිබඳ ගිබ්සන් දක්වන සැලකිල්ලෙන් සාම්ප්‍රදායික කතෝලික හෝ ක්‍රිස්තියානි ආගමට සම්බන්ධයක් පවතින්නේ සාපේක්ෂව සුලුවෙන් යැයි යලි අවධාරනය කල යුතු ය. වධ විඳීම සඳහන් වන්නේ සෑම ශුභාරංචියක ම පරිච්ඡේද තුනක හෝ හතරක ය. (මතෙව්හි, 26-28ඃ මාක්හි, 14-16ඃ ලූක්හි,22-24ඃ ජෝන්හි, 18-21) මාක් කෙටියෙන් ම මෙසේ කියයිඃ ''එය තෙවන පැය විය, ඔවුහු ඔහු කුරුසියේ තබා ඇන ගැසූහ.'' ශුභාරංචි තුල අවධාරනය යොමු වන්නේ යේසුස්ගේ ඉගැන්වීම් මත විනා ඔහුගේ භයංකර මරනය මත නො වේ.

කැනේඩියානු කතෝලික පූජකයෙකු වූ ජිරාල්ඩ් කැරොන් මෙසේ ලියයිඃ ''... ඔහුගේ පනිවුඩයට හා යාවජීව දූත මෙහෙයට අසම්බන්ධීව යේසුස්ගේ වධ විඳීම හා මරනය පිළිබඳව මෙබඳු දර්ශනයක් නිර්මානය කිරීම දේව ධර්ම ශාස්ත්‍රය අනුව ගත් විට වැරදි සහගත ය. අප පාපයෙන් ගලවා ගන්නේ රුධිරයේ හෝ වධ විඳීමේ පරිමානයෙන් නොව -- 10ඃ45හි මාක් කියන පරිදි 'සේවාවේ' ජීවිතයක අභිෂේකය වූ -- යේසුස්ගේ මරනයෙනි. එය දෙවියන් වහන්සේට ඔහු විසින් ගෙවිය යුතු වූ මිල නො ව, තම ජීවිතයේ කැඳවුම හා දූත මෙහෙයට කැපවී සිටීම සඳහා ගෙවිය යුතු වූ මිල යි. ඔහුව කුරුසිය කරා මෙහෙයවා ලූයේ දෙවියන් වහන්සේගේ පාලනය ගැන ඔහුට පැවති දැක්ම යි. එහි ප්‍රතිවිරුද්ධය නො වේ.

1200 ගනන් අග හා 1300 ගනන් මුල ජොටෝගේ පටන් දාහත් වන සියවසේ ශ්‍රේෂ්ඨ නිර්සාමයික ලන්දේසි යුග සිත්තරුන්ගේ යුගය තෙක් බටහිර කලාවට යේසුස්ගේ හා විශේෂයෙන් ම යේසුස්ගේ වධ විඳීමේ ප්‍රතිරූපවලින් තොරව සිතීමට පවා නුපුලුවන් විය. ක්‍රිස්තුන්ගේ වධ විඳීම හා මරනය ඔසවා තැබූ එම සිත්තරුන්ගේ ලැයිස්තුවෙහි හමු නො වනු නැති ශේෂ්ඨ නම් පෙලට බෙලිනි, මැන්ටේන්ය, එල් ග්‍රෙකෝ, බොෂ්, ඩ්‍යුරර්, කැරවැජියෝ, වැන් ඩයික්, පියරෝ ඩෙලා ෆ්‍රැන්සෙස්කා, ෆ්‍රා ඇන්ජෙලිකෝ, ග්‍රෲනෙවාල්ඩ්, ටිෂාන්, කොරේජියෝ, රේම්බ්‍රාන්ට්, ලියොනාර්ඩෝ (''අවසන් භෝජන සංග්‍රහය''), මයිකලැන්ජලෝ, රෆේයල්, ටින්ටොරේටෝ, බොටිසෙලි, වැන් අයික්, ක්‍රැනැක්, රූබින්ස්, විලාස්ක්විස්, සහ තවත් බොහෝ අය අයත් වෙති.

වර්තමාන කෞතුකාගාර නරඹන්නෙකු ආගමික ප්‍රතිරූප සමූහයෙන් විඩාවට පත් විය හැකි නමුදු එකල කලාකරුවන්ට හා නරඹන පොදු ජනතාවට ඒවායේ දැවැන්ත සාමූහික ආත්මීය අරුතක් පැහැදිලිව ම තිබින. ක්‍රිස්තියානි ආගමෙහි ''දෙයාකාර ගනන් තැබීම'' -- ට්‍රොට්ස්කි එය එසේ සඳහන් කලේ ය -- මෙම ජීවිතයේ දුක්කම්කටොලු නැතිකලා නො වේ, ඒවා හුදෙක් ම කල්පිත ලෙස විසඳා ලූයේ ය. සමාජය, පීඩිත ජනතාවට පරලොව දී මාරු කර ගත හැකි ප්‍රොමිසරි නෝට්ටු පත්‍රයක් පල්ලිය ලවා බෙදා හැරීම යි. එහෙත් කලාකරුවෝ සහ නරඹන්නෝ යන දෙගොල්ලෝ ම තම දුක් වේදනා ගැන ගැඹුරින් සැලකිලිමත් වූත් තමන් වෙනුවෙන් මිය ගියා වූත් නැවත පහල වීම මගින් මිහිපිට දෙව්ලොවක් බිහිවීමේ බලාපොරොත්තුව ජනිත කලා වූත් යේසුස්ගේ මරනයෙන් සහ යලි ඉපදී ම මගින් සැබෑ සැනසීමක් ලබා ගත්හ.

ගිබ්සන්ගේ *ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට්* චිත්‍රපටය වචනයේ හොඳම අර්ථයෙන් ''ක්‍රිස්තුන් බඳු'' සියල්ල මහත් ලෙස අවිද්‍යමාන 'මානව වර්ගයා කෙරෙහි ප්‍රේමයෙන් හා සානුකම්පාවෙන් කෙරුනු' කෘතියකි.

පශ්චාත් යුද බයිබලමය වීර කාව්‍ය (*ක්වෝ වාඩිස්* [ඔබ කොයිබට ද?], *ද රෝබ්* [ලෝගුව], *ඩිමිට්‍රියස් ඇන්ඩ් ද ග්ලැඩියේටර්ස්* [දිමිත්‍රියස් හා බංගධරයෝ], *බෙන් හර්, කිංග් ඔෆ් කිංග්ස්* [රාජාධිරාජ], *බරබ්බස්, ද ග්‍රේටස්ට් ස්ටෝරි එවර් ටෝල්ඩ්* [මෙතෙක් කියූ ශ්‍රේෂ්ඨතම කතාව] ) වැනි චිත්‍රපටවල අදක්ෂකම් හා ඇතැම් විට ඍජු අඥානකම් තිබූ නමුත් ඒවා නිශ්චිත තේමාවන් හඹා ගියේ යඃ එනම් දරා සිටීම, සමාව, නිල මර්දනය සහ ක්‍රෑරත්වය කෙරෙහි විරෝධය යි. විශේෂයෙන් ම හිට්ලර්ගේ සමූල ඝාතනවල හා ලෝක සංග්‍රාම දෙකෙහි සටන් බිම්වල ලත් භයානක ප්‍රතිඵල තුල දී චිත්‍රපටිකරුවන් දුටුවේ විශ්ව සහෝදරත්වයේ හා දුෂ්ට පාලනයට විරෝධය පෑමේ පනිවුඩය ප්‍රේක්ෂක සංවේදය සොයා ගනු ඇතැයි යන්න ය.

විලියම් වයිලර්ගේ *බෙන්හර්* (1959) චිත්‍රපටියේ පිපාසිත වහලකුට යේසුස් දිය පොදක් දෙන දර්ශනය බොහෝ අයට අමතක නො වේ. එයින් කේන්තියට පත්වෙන සොල්දාදුවෙකු ක්‍රිස්තුන්ට තර්ජනය කරයි. ජේසුන් දයාවේ සංක්ෂේපයක් ලෙස එහි සිටගෙන බලා සිටින අතර සොල්දාදුවා දමනය වී පසු බායි.

සෑම පරම්පරාවක් ම තමාගේ ම ප්‍රතිරූපය තුල යේසුස් කෙනෙකු ප්‍රතිනිර්මානය කලේ ය, පයර් පාඩලෝ පැසොලීනිගේ *ද ගෝස්පල් එකෝඩින්ග් ටු සේන්ට් මැත්‍යු* ([සාන්ත මතෙව්ට අනුව ශුභාරංචිය], 1964) චිත්‍රපටය ''විමුක්ති දේව ධර්ම ශාස්ත්‍රය'' හා බැඳි රැඩිකලීකෘත යුගයට ලිහිල්ව අයත් වෙයි. පැසොලීනිගේ කෘතිය 1960 ගනන් මුල ඉතාලියෙහි සිදු වූ කතෝලික-කොමියුනිස්ට් පක්ෂ ප්‍රතිමිතුදමේ උපනිෂ්පාදනයක් ලෙස පැමිනීම නිසා අවස්ථාවාදය පිළිබඳ සැකයකින් නොතොර වුව ද ඇතැම් විට ජීවයෙන් යුතු ය. පැසොලීනිගේ ක්‍රිස්තු මුදල් පොලී කරන්නන් සාහසික ලෙස ආරාමයෙන් පන්නා දමයි, තමන්ගේ දේපොල අත් හරින ලෙස හා තමන්ගේ පවුල්වලින් බිඳෙන ලෙස සිය ශ්‍රාවකයන්ට අන කරයි, දිලින්දන් සහ දීනයන් කෙරෙහි තම කැමැත්ත පල

කරයි.

ගිබ්සන්ගේ මනස තුල ඇත්තේ වෙනත් යමකි. නලුවා / අධ්‍යක්ෂවරයා සතුව නියත දේශපාලන න්‍යාය පත්‍රයක් නැතිවා විය හැකි නමුදු ඔහු අවිහිංසක නො වේ. *වෝල් ස්ට්‍රීට් ජර්නල්* ප්‍රවෘත්ති පත්‍රයෙහි පෙගී නූනාන්, *නැෂනල් රිවීව්*හි කේට් ඕ'බීරන්, වෙලඳ මන්ඩල තීරු ලිපි රචිකාවක හා ෆොක්ස් නිව්ස් චැනල් රූපවාහිනී නාලිකාවේ විශ්ලේෂිකාවක වන ලින්ඩා චාවේස් සහ බුෂ් පරිපාලනයේ ''ආගම-පාදක මූල පිරීම'' නමැති වැඩ සටහනේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩේවිඩ් කුවෝ -- සියල්ලෝ ම දක්ෂිනාංශික දුර්ජනයෝ ය -- වැන්නන් සඳහා පසු ගිය ගිම්හානයේ තම දල පිටපත තිරගත කර තිබීම ඔහුගේ සාමාන්‍ය දිශාවනතය පිලිබඳ හොඳ සංඥාවක් සම්පාදනය කරයි.

සාම්ප්‍රදායිකවාදී කතෝලික පසුබිම දක්ෂිනාංශික දේශපාලනය සමග නො වෙන් කල හැකි ලෙස බැඳී පැවතී ඇත. ''තම ත්‍යාගවන්ත භාවය නිසා ම රැඳී පැවතියා වූ සංස්කෘතික ජීවිතය හා අනෙකුත් ආගම් මත කතෝලිකවාදය නිතරග ආධිපත්‍යයක් භුක්ති විඳි 16 වන ලුවීගේ ප්‍රන්සය කරා හෝ ෆ්‍රැන්කෝගේ ස්පාඤ්ඤය කරා ගෙන යනු ලැබීමට වැඩිමනත් දෙයකට'' එහි අනුගාමිකයෝ ''නො කැමතියහ'' යි මයිකල් කුනියෝ ද *ස්මෝක් ඔෆ් සේට්න්* (සාතන්ගේ දුමාරය) නමැති තම කෘතියෙහි ලිවී ය. සාම්ප්‍රදායිකවාදී ව්‍යාපාරයේ ප්‍රාරම්භකයෙකු වූ ප්‍රන්ස ජාතික අග්‍රරාජගුරු ප්‍රසාදී මෙයාර්සිල් ලෙෆෙබ්ව්‍ර හා ඔහුගේ අනුගාමිකයන් යුදෙව් විරෝධය කා වැදුනු අන්ත දක්ෂිනාංශික දෘෂ්ටිවාදයකට සහාය දුන්හ යි *වර්ඩික්ට් ඔන් වීශී* (වීශිය ගැන තීන්දුව) නම් සිය කෘතියෙහි මයිකල් කර්ටිස් පෙන්වා දෙයි. දෙවන ලෝක මහා සංග්‍රාමය අතරතුර කාලයේ දී වීශි නගර පොලිස් භටයෙකු ලෙස සේවය කරමින් යුදෙව්වන් වධබන්ධනයට ලක් කල හා මරනයට පත් කල පෝල් ටූවයර්ට ඔවුහු වසර ගනනාවක් තිස්සේ අභයස්ථානය සම්පාදනය කලෝ ය.

මෙබඳු අදහස් හා පිරිස් සමග අත්වැල් බැඳ මනුෂ්‍යත්වයට යුක්තිය ඉටු කිරීමක් ශුභාරංචිවල එන යේසුස් පිලිබඳව සැබවින් ම ප්‍රගාඪ විප්ලවකාරී පනිවුඩයක් ගෙන ඒමත් ගිබ්සන්ට කෙසේ නම් ඉටු කල හැකි වේ ද?

''ආශීර්වාද ලද්දෝ හදවතින් නිර්මල වෙති, එනිසා ඔවුහු දෙවියන් දකිනු ඇත්තාහ'' යි යේසුස්ගේ කන්ද උඩ දේශනාවෙන් උපුටා දක්වන ජර්මානු දර්ශනවාදියෙකු වන හේගල්, මෙය ''උදාරතර ම සරල බව පිලිබඳ නියමයක්'' යැයි හඳුන්වයි. මෙම ''නිර්මල හදවත'' ''සාමයේ නිර්මාතෘවරුන්'' වෙනුවෙන්, ''ධර්මිශ්ඨ බව උදෙසා වධබන්ධනයට ලක් වූ'' අය වෙනුවෙන්, ''ස්වර්ගයෙහි සිටින ඔබගේ පීතෘවරයා පරිපූර්න වන්නා සේ එවා පරිපූර්න'' වීමට පරිශ්‍රම දරන්නන් වෙනුවෙන් ප්‍රේමයෙන් සපිරිව ඇතැයි තව දුරටත් දේශනාවෙන් උපුටා දක්වමින් හේගල් පෙන්වා දෙයි. කවර නම් විශිෂ්ටතර හැඟීම් ද!

මෙම නිර්දය වූ මතය නො වැලැක්විය හැකි ලෙස ම ''විවාදාත්මක'' (විප්ලවවාදී-ප්‍රායෝගික) ස්වරූපයක් ආරෝපනය කර ගත යුතු ම ය යි හේගල් ප්‍රකාශ කරයි. ''ආත්මයෙහි පාරිශුද්ධත්වය අවුල් කරන කුමක් වුවත් විනාශ කල යුතු ය,'' යි ඔහු දිගට ම ලියයි. ''මැලව ගිය තෝ සපරිපූර්න වනු, ගොස් තෝ සතු දේ විකුනනු, එවිට එය දුප්පතුන්ට දෙනු, ස්වර්ගයෙහි වන නිධානයක් මෙලෙස තෝ සතු වනු ඇත, එවිට එනු, මා අනුයනු'' යි තව දුරටත් යේසුස් උපුටා දක්වමින්, ''මෙම උපදේශය මෙසේ ම ඉටු විනි නම් සමාජ විප්ලවයක් සිදු විය යුතු ම ය: දිලින්දන් පොහොසතුන් බවට පත් වනු ඇත'' යි හේගල් ඊට එකතු කරයි.

මුල් ක්‍රිස්තියානිය සහ සමාජවාදී කම්කරු පන්ති ව්‍යාපාරය අතර වන සාම්‍යය සමාජවාදීන් නිතර ම සඳහන් කර ඇත. ව්‍යාපාර ද්වයය ම පැන නැංගේ පීඩිතයන්ගේ ව්‍යාපාර ලෙසිනි, ක්‍රිස්තියානිය වහලුන්ගේ හා නිදහස ලද වහලුන්ගේ, සියලු අයිතීන්ට අහිමි කල දුප්පත් මිනිසුන්ගේ ව්‍යාපාරයක් ලෙසිනි. ව්‍යාපාර ද්වයය ම දාස භාවයෙන් හා දුකඳුරින් විමුක්ත අනාගතයක් දේශනා කල අතර එය පෙරදැකී ය, ක්‍රිස්තියානිය ගැලවුම පරලොවෙහි පිහිටුවී ය, සමාජවාදය මිහිපිට කොන්දේසි පරිවර්තනය කිරීම සඳහා අරගල කලේ ය. ව්‍යාපාර ද්වයය ම කෘෘර හිංසා පීඩාවන්ට විෂය විය, නොයෙක් තන්හි දී නීති විරෝධී කරනු ලැබී ය. පවත්නා සමාජ පර්යායේ සතුරන් වෙතැයි ප්‍රකාශයට පත් කරනු ලැබී ය.

අතීතයේ සෑම බයිබලමය වීර කාව්‍යයක දී ම වාගේ ආසන්න වසයෙන් සඳහන් කරමින් පසු කොට යන බව පෙනෙන මෙම විප්ලවකාරී, සමාජවාදීමය හරය ගිබ්සන්ගේ *වධ විඳීමෙන්* අතුරුදන්ව ඇත. ඒ වෙනුවට චිත්‍රපටයේ සැබෑ සාධනීය හරය අත් කර ගත්තේ කුමක් මගින් ද?

## අන්තපත් පෞරුෂත්වය

වීසෙල්ටයර් හා අනෙකුන් බඳු විචේචකයෝ චිත්‍රපටය විචේචනය කර ලකුනු දමා ගැනීමට සමර්ථයෝ වෙත්. ඔවුන් දැඩි විරුද්ධත්වයක් පවා ප්‍රකට කරනු ඇත. *වොෂින්ටන් පෝස්ට්*හි රිචර්ඩ් කොහෙන් ගිබ්සන්ගේ චිත්‍රපටයෙහි වන ප්‍රචන්ඩත්වයේ ලබ්ධිය වෙත නීති යුක්ත ලෙස ඇඟිල්ල දිගු කරන අතර එය ''ෆැසිස්ට්වාදීමය'' ලෙස හඳුන්වයි. එහෙත් මෙම ලිබරල් හා ආදියෙහි ලිබරලුන්ව සිටි විචේචකයන්ගෙන් එක් අයෙකු වත් ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට් චිත්‍රපටය වර්තමාන ඇමරිකාව හෝ එහි අසන්තුෂ්ටියට පත්ව සිටින්නන් ගැන අපට කිසි යම් ම දෙයක් කියන්නේ දැයි යන්තමින්

වත් නාගවයි.

ගිබ්සන් යනු පැහැදිලිව ම එක් හෝ අනෙක් වර්ගයක දේශපාලන දක්ෂිනාංශිකයෙකු වෙතත් -- කෙනෙකුට කිව හැකි පරිදි එය නිසැක ලෙස ම බුෂ්ගේ මැතිවරන ව්‍යාපාරයෙහි අමුද්‍රව්‍යයක් බවට පත් වී තිබුනත් රිපබ්ලිකන් මැතිවරන වේදිකාවේ එලකයක් පවා වී තිබුනත් -- චිත්‍රපටය පහසුවෙන් එම මානයන් කරා සිඳුවිය නො හැකි ය.

වඩා පොදු වූ සමාජ-මනෝ විද්‍යාත්මක සන්තතියක් පිලිබඳව චිත්‍රපටය සාක්ෂ්‍ය දරයි. අතිශයින් ශක්ති සම්පන්න ලෙස මතු වන දෙය වනුයේ නිශ්චිත සමාජ ස්තරවල දොම්නස් සහගත බව, නුරුස්සනසුලු බව හා ආත්මානුකම්පා සහගත බව පවා වේ.

ක්‍රිස්තුන්ගේ වධ විඳීම පිලිබඳ සාම්ප්‍රදායික චිත්‍රනය තුල රෝමානු සොල්දාදුවන් හා යුදෙව් බලා සිටින්නන් නියෝජනය කරනුයේ අපයි -- කලාකරුවා හෝ කලාකාරිය මත් ඇතුලත් වන පොදු මනුෂ්‍යත්වය යි. යේසුස්ගේ මරනය මගින් මතුව එන්නේ පාපකාරිත්වය සඳහා, මධ්‍යස්ථ භාවය සඳහා, උදාරත්වය සඳහා වන මානව ශක්‍යතාවන් ය. එහි අරමුන වූයේ මෙම ගතිස්වභාවයන් ඉස්මතු කිරීම මගින් අප ''හදවතින් නිර්මල'' වන තරම අපට ම විභාග කර ගැනීමට අවසර ලබා දීම ය. ගිබ්සන් මේ ගැන එතරම් උනන්දුවක් දක්වන්නේ නැත. එබඳු සලකා බැලීම් බොහෝ දුරට ම පසෙකට අතු ගා දමෙයි.

ගිබ්සන්ගේ චිත්‍රපටයේ රචනයෙහි ලා අර්ධස්වයංචරිතාපදානමය ආවේශයක් පවතින බව සැබවින් ම හැඟෙයි. මෙහිදී අප සඳහන් කරන්නේ ඔහුගේ පෞද්ගලික මනෝ විඥානමය තත්වය ගැන නො වේ. නලුවා/අධ්‍යක්ෂවරයා තමන් මත් වධබන්ධනයට ලක්ව ඇති, වරදට ලක්ව ඇති, වක්‍ර ලෙස කටු සැමිටි පහරට ලක්ව පවා ඇති මිනිසෙකු ලෙස හොඳින් ම දක ගනු විය හැකි ය. පෞද්ගලික යක්ෂයන් මෙහි ලා කාර්ය භාරයක් ඉෂ්ට කරනු නිසැක නමුත් ගිබ්සන්ගේ ආත්මයෙහි ඇති ආක්‍රමනශීලිත්වයේ හා අකර්මන්‍යභාවයේ මිශ්‍රනය අප්‍රධාන වන්නක් වේ.

මෙහි දී අප කථා කරන්නේ දොම්නස්පත්, කරදරපත් සමාජ ප්‍රකාරයන් ගැන ය. එක්සත් ජනපදය තුල සාපේක්ෂව ගැඹුරු මූලයන් පවතින්නා වූත් මෑත වසරවල දී වඩා පැහැදිලිව දෘෂ්‍යමාන තත්වයට පත් වූත් ඔහු නියෝජනය කරන (පුලුල් ම අර්ථයෙන්) දේශපාලන ප්‍රවනතාව ගැඹුරු නො රිස්සීමක හා සිහි විකල් වීමක හැඟීම් සමග සම්බන්ධ වන්නකි.

ඇමරිකානුවන් හා ක්‍රිස්තියානිකයන් විශේෂ ආකාරයකින් අන්තරායට පත් වර්ගයන් යැයි ද සාර්වත්‍රිකව ම වාගේ සතුරු වූ ලෝකයකට මුහුන දෙන්නේ යැයි ද එබඳු දක්ෂිනාංශික පුද්ගලයන් හා කල්ලි කන්ඩායම් ඒත්තු ගන්වනු ලැබේ. මෙම බලවේගවලට පෙනෙන පරිදි ග්‍රහලෝකය ම සතුරන්ගෙන් පිරී ඇත, සැප්තැම්බර් 11දා සිදුවීම් මෙම කරුන තහවුරු කලේ ය. ''පාපයේ අක්ෂයට'' එරෙහි උත්තම අරගලයක් සඳහා වන බුෂ්ගේ කැඳවුම අයිතිය තහවුරු කිරීමක් ලෙස හා රන ඝෝෂයක් ලෙස සේන්දු වූයේ යම් සමාජ ස්ථරයකට ඒ මෙය යි. ''සියල්ලෝ ම තමන් අල්ලා ගැනීම සඳහා ලුහුබඳිත්'' යැයි ඔවුහු සිතා ගන සිටිති. බලගතු ස්වයං මුලාවක් සහිතව ක්‍රියාත්මක වෙමින්, ලෝකය උඩු යටිකුරු කොට පෙරලමින් ඔවුහු ඇමරිකාව - ව්‍යාජෝක්තිවලත් ව්‍යාජෝක්තිය! - ගොදුර ලෙස දක ගනිති.

නොසලකා හරිනු ලැබීමෙන් හා හිංසා පීඩා කරනු ලැබීමෙන් තමන් හා අනෙකුත් ක්‍රිස්තියානි ඇමරිකානුවන් දඩි බවට පත් කර ඇතැයි හඟින මෙම ආන්තික පුද්ගලයින්ගේ පන්තියට ගිබ්සන් අයත් වෙයි. ඔහුගේ පියා සම්බන්ධව කිව හොත් මෙය කුමන්ත්‍රන මේනියාවක් ද කතෝලික දේව සභාවේ ධුරාවලියට යුදෙව්වන්ට සහ සැබෑ ධර්මයට ද්‍රෝහි වූ සියල්ලන්ටම එරෙහිව බද්ධ වෛරයක් නිර්මානය කලේ ය. කවරෙකුට හෝ කබොල්ල එසවීමට සිදුව ඇත... පැසවූ කබොල්ල වනාහි වතිකානුව යි'' යන වදන් පෙල උච්චාරනය කරමින් *කන්ස්පිරසි තියරි* (කුමන්ත්‍රන සිද්ධාන්තය) නමැති චිත්‍රපටයෙහි ඔහු පුතු පෙනී සිටි බව යමෙකු සිහියට නගා ගත යුතු ය.

මෙම අතිශයින් සිහි විකල් වූ සමාජ කොටස් ඉක්ම යන ආකර්ෂනයක් ගිබ්සන්ගේ චිත්‍රපටය සතුව සැබවින් ම ඇත. එම ආකර්ෂනය ප්‍රධාන කොට ම ඇත්තේ මූලධර්මවාදී ක්‍රිස්තියානිකයන්ගේ පුලුල් ස්තරයක් වෙත ය. එහෙත්, ඉවැන්ජෙලික ක්‍රිස්තියානියේ (සහ එහි නියත කතෝලික ප්‍රභේදයන්ගේ) වැඩීම මූලිකව ම, එක්සත් ජනපදය තුල සැලකිය යුතු ජන සංඛ්‍යාවකගේ වැඩි වන ව්‍යාකූල භාවයක හා අදිශාවනතයක ඒකාග්‍රිත දෘෂ්ටිවාදීමය ප්‍රකාශනයක් නො වන්නේ නම් එය නියෝජනය කරන්නේ කුමක් ද?

එබඳු ප්‍රපංචයක් වටහා ගැනීම ඉතා අපහසු වන්නේ නො වේ. කෙනෙකු කල යුත්තේ පසු ගිය දශක කීපයක් තිස්සේ ඇමරිකානු සමාජය තුල සිදුව ඇති දවැන්ත පරිවර්තනයන් සැලකිල්ලට ගැනීමට පමනි. ප්‍රථම කොට ආර්ථික පරිවර්තනයෝ යඃ මුලු මහත් කර්මාන්තවල හා අවට ප්‍රදේශවල මහා පරිමාන විනාශය හෝ පරිහානිය, ගෝලීයකරනය හා පරිඝනීකරනය සමග සම්බන්ධිත වෙනස්කම්, සාම්ප්‍රදායික ග්‍රාමීය පමනක් නොව සුලු-නාගරික ඇමරිකාව පවා සැබෑ ලෙස අන්තර්ධාන වීම. මේ හා කැටුව පවුල් සංස්ථාව හා ආගමික බඳවාගැනීම් තුල, සමිති සාමාජිකත්වය තුල, වෘත්තීය සමිති සාමාජිකත්වය තුල වෙනස්කම් - පොදුවේ ගත් කල සියලු පැරනි පක්ෂපාතකම් ලිහිල් වී හෝ බිඳී ගොස් ඇත.

මහජනතාවට මුලුමනින් ම හොර රහසේ බරපතල තීන්දු ගනු ලැබේ: එනම් යුද්ධයට යාම හෝ අලුත් ඒවාට සේන්දු වීමට, සමාජ සුභ සාධක රාජ්‍යය අහෝසි කර දැමීමට, අත්‍යවශ්‍ය සේවාවන් අක්‍රමවත් කිරීමට හෝ ඉවත ලීමට යි. ඒ අතරතුර ම නිල ලත් සමාජය එහි ලිබරල් සම්මුතිය අත හැර දමයි, දකුනට වේගයෙන් පෙරලී යයි, ආගමික අන්ධ විශ්වාසයන් හා අවිචාර සම්මතයන් ද ඇතුලුව සෑම වර්ගයකම පසුගාමීත්වය දිවුනුපවුනු කරයි.

මේ සියල්ල සාකච්ඡාවට භාජන නො කෙරෙයි, විවාදයට භාජන නොකෙරෙයි. ඇමරිකානු දේශපාලන ජීවිතය දුරස්ථ, පිටස්තර හා සතුරු යමක් ලෙස, එනම් මුලුමනින් ම නිෂ්ඵල වූවක් ලෙස මහා ජනකායන්ට පෙනී යයි. ඓතිහාසික දෘෂ්ටි කෝනයෙන් බැලූ කල්හි මල සිරුරක් වන ද්විපක්ෂ පද්ධතිය, ජීවත්වන ජනයා එහි අතිවිශාල, හා සෙලවිය නො හැකි ලෙස පෙනෙන බරින් මිරිකා දමයි.

මහජනතාවගේ පුලුල් ස්තරයන්ට බල රහිත බවක්, අද්දරට ම තල්ලු වී සිටින බවක්, තැලුම් කෑ බවක් හා කටු සැමිටියෙන් පහර කෑ බවක් පවා හැඟී යෑම කිසිම පුදුමයක් ද? තමන් අත්හැර දැමී ඇතැයි ද පාවා දෙනු ලැබ ඇතැයි ද තමන්ට වධ දෙන්නන්ගේ ගොදුරක් වී ඇතැයි ද වධයට ලක් වූත්, සන්තාපයට පත් වූත් දශලක්ෂ ගනන් ආත්මයෝ ඇමරිකාවෙහි සිටිති. පුලුල් පදනම් සහිත කිසිදු ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාරයක් සමග සමහම් විය නො හැකි මෙම ජනතා අපේක්ෂා භංගය කිසිසේත් ම ආකර්ෂනීය නො වූත් සමාජ විරෝධී පවා වන නමුත් විවිධ රූපාකාරයන් තුල ප්‍රකාශනයක් අත් කර ගනියි. මෙම යථාර්ථය වැරදි ලෙස විනිශ්චය කිරීම හෝ ඒ කෙරහි අන්ධව සිටීම ඇමරිකානු සමාජ අර්බුදයේ ගැඹුර අවතක්සේරු කිරීමකි.

වධ විඳීමට ඇමරිකාව තුල ලැබුනාට සමාන ම ප්‍රතිචාරයක් බටහිර යුරෝපය තුල ලැබේ යැයි සිතීම නිවැරදි යැයි හැඟේ. එසේ වන්නේ, ඉතිහාසයෙන් නිපන් දෘෂ්ටිවාදීමය දුෂ්කරතා එක්සත් ජනපදයෙහි පැවතියත් - ඇමරිකානුවන් සහජයෙන් ම ආගමික උමතුවෙන් පීඩා ලබන නිසා නො වේ - ඇමරිකානු එක්සත් ජනපදය තුල මෙන් දියුනු කාර්මික ලෝකයේ අන් කිසිම තැනෙක වෘත්තීය සමිති නිලධරයේ අත්‍යාවශ්‍ය වූ සහයෝගය ද ඇතිව, සමාජ ක්‍රියාමාර්ග විනාශ කිරීමේ දී ද ලාභයේ අවශ්‍යතා වෙනුවෙන් ජීවන තත්වයන් පහත හෙලීමේ දී ද විරුද්ධත්වය සහ ප්‍රතිරෝධය අඩපන කිරීමේ දී ද අත් කර ගෙන නැත.

ගිබ්සන් පීඩිතයෙක් නො වේ. ඔහු ප්‍රකෝප්පතියෙකි. ආගමික ආවේගයට මාක්ස් දුන් නිර්වචනය වූ ''පීඩිතයන්ගේ සුසුම් ලෑම'' ඔහුගේ චිත්‍රපටය තුල නො පවතී. එසේ වුව චිත්‍රපටය කෙරෙහි වන ප්‍රතිචාරය තුල ''පීඩිතයන්ගේ සුසුම් ලෑමේ'' යමක් පවතී. ද පෑෂන් ඔෆ් ද ක්‍රයිස්ට් ප්‍රතිගාමී චිත්‍රපටයකි, එහෙත් පහල මධ්‍යම පන්තියෙන් හා කම්කරු පන්තියෙන් ඇද ගැනී අවුත් පිරිතිරී යන සේ පෙනෙන නරඹන්නන්ගේ බහුතරය ප්‍රතිගාමී වෙතැයි කෙනෙකු නිගමනයක් ඇති කර ගැනීම යුතු නැත. මෙය ප්‍රකට සමාජ පනිවුඩයක් සහිත චිත්‍රපටයක් නො වේ. ගිබ්සන් වත් බුෂ් පරිපාලනය තුල හෝ අවට සිටින ඔහු දැන් සමාගම් පවත්වන්නන් වත්, තම විද්වද්වේෂී, දක්ෂිනාංශික දේශපාලන න්‍යාය පත්‍රය චිත්‍රපටයකින් පෙරට තැබුව හොත් මහා ජනකාය එය නැරඹීමට ඇදෙනු නැත.

දේශපාලන නායකයෙකු ''හැම විට ම මහජනයා අතර සබඳතාවකි, එනම් සාමූහික ඉල්ලුම සපුරා ලීමට වන පෞද්ගලික සැපයුමකි'' යි ට්‍රොට්ස්කි වරක් පෙන්වා දුනි. ගිබ්සන් දේශපාලන නායකයෙකු නො වේ. එහෙත් පැවසිය හැකි දෙයක් නම්, සෑම ප්‍රධාන සංස්කෘතික ප්‍රපංචයක් ම -- ඒවායින් ඉතාම ප්‍රතිගාමී වූව පවා -- ''මහජනයා අතර සබඳතාවක්'', නැතහොත් සමාජමය ඉල්ලුමකට ප්‍රතිචාරයක් වන බව යි. කෙසේ වුව ද මෙහි පවතින ඉල්ලුම බොහෝ විසිර ගිය වූත් ව්‍යාකුලිත වූත් අසමාන සමාජ මූලයන්ගෙන් සෑදුනක් වූත් එකක් වෙයි.

වධ විඳීම නරඹන්නෝ ඒ තුලට නොයෙක් අර්ථ පටවති. වර්තමාන ආකුලිත දෘෂ්ටිවාදීමය කොන්දේසි යටතේ එහි ආයාචනය අසමාන හා විරුද්ධ සමාජ ස්තරයන් තුලට පවා පැතිරී යයි. ප්‍රචන්ඩත්වය කෙරෙහි මෙම චිත්‍රපටය දක්වන ලෝලීත්වයට ද එහි පිලිබිඹුවන උමතුව හා දොම්නසට කුල්මත් වී ඇදී යන්නා වූ ද ඇමරිකාව, අරාබි හා සෙසු ත්‍රස්තවාදීන් විසින් ද කෙලෙහි ගුන නො දන්නා වූත්, පලි ගන්නා වූත් පැරිසීන් වැනි ප්‍රන්සයින් හා ජර්මානුවන් ගෙන් ද කසපහර දෙනු ලැබූ හා වධයට පත් කරනු ලැබූ රටක් ලෙස දකින්නා වූ ද පැහැදිලිව ම අන්ත දක්ෂිනාංශික වූ නො වේ නම් ෆැසිස්ට්වාදීමය කන්ඩායම් සිටිති. ඔවුහු ඔවුන්ගේ ම වූ ''කැප කිරීම්'' සිදු කිරීම සඳහා හුරු පුරුදු වීමට අවශ්‍යව සිටින ප්‍රතිගාමී බලවේගයෝ වෙති.

මේ මොහොතෙහි එදිනෙදා ජීවිතයේ ''තමන්ගේ ම කුරුසිය බදා වැලඳ ගැනීමට'' වික්‍රමාන්විත ලෙස, නමුත් බොහෝ විට නිරර්ථක ලෙස තැත් කරන අව්‍යාජ වූ පීඩිත ජනතාවන් ද චිත්‍රපටය ආකර්ෂනය කර ගනී. ඔවුහු යේසුස්ගේ වධවේදනාවන් තමන්ගේ ම වන ග්‍රහනයන් වෙත එලඹෙන මාධ්‍යයක් ලෙස ගෙන සැනසීමක් ලැබ ගනිති. මෙය කිසි සේත් ම අධම ප්‍රයත්නයක් නො වේ. කෙසේ වුව මෙම ප්‍රතිචාරයට ම වෙනත් බෙලහීන අරුතක් ඇත. එය අවිරෝධයේ ධර්මයක ප්‍රකාශනයක් ලෙස හා යමෙකුගේ ඉරනමට යටත් වීමක ප්‍රකාශනයක් ලෙස ය. මොවුහු තමන්ගේ ම ගැටලු තුලට හා තත්වය තුලට පෘථුල වූ අන්තර්ඥානයක් තව මත් නැති මහජනතාවෝ ය.

ද පැෂන් ඔෆ් ද ක්‍රයිස්ට් වනාහි ගර්හා කටයුතු කෘතියකි. චිත්‍රපටය වර්නනා කරන්නෝ, හෝ එහි ප්‍රතිගාමී ස්වභාවය පහත හෙලන්නෝ, හෝ මූලධර්මවාදී දකුනෙන් එන උල්පන්දම් දෙන්නන් පිලිබඳ භීතිය නිසා නිහඬව සිටින්නෝ දේශපාලන ප්‍රතික්‍රියාවට තුමූ ම සේවා කරති.

කෙසේ වුව ද මෙම චිත්‍රපටය කලාත්මක වසයෙන් හා බුද්ධිමය වසයෙන් සලකා බලන විට වැදගත්කමක් නැත්තක් වුව ද, එය, එය ම හා එහි අධ්‍යක්ෂවරයා ඉක්ම යන ප්‍රතිචාරයක් පැන නංවා ඇත. ගිබ්සන්ගේ කෘතියේ ක්ෂනික ඉරනම කුමක් වුවත් ඊට වන පිලිගැනීම අන් සියල්ලට මත් වඩා තමන්ගේ ම වූ අසාමාන්‍ය වධ විඳීමට නො වැලැක්විය හැකි අන්දමින් මුහුනට මුහුන ලා පිහිටා සිටින ඇමරිකානු ධනවාදී සමාජයේ වඩ වඩාත් අස්ථාවර වන සමාජමය හා සදාචාරමය තත්වය සලකුනු කරයි.

© www.wsws.org